දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්

First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

# ආවිප්‍ර 1.2 - ආර්ථික සංවර්ධනයේ ඉතිහාසය
# EC 1.2 – History of Economics Development

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

පැහැදිලි අත් අකුරින් පිළතුරු සපයන්න

---

01. (i) මධ්‍යකාලීන යුරෝපයේ ක්‍රියාත්මක වූ වැඩවසම් සමාජ ක්‍රමයේ හඳුනා ගත හැකි පොදු ලක්ෂණ කවරේ ද?

(ලකුණු 06 යි)

(ii) දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ලක්ෂණයන්ගෙන් වැඩවසම් සමාජ ක්‍රමය පරිවර්තනයකට ගමන් කළ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

(iii) 14 හා 15 වන සියවස්වලදී වැඩවසම් සමාජ ක්‍රමය සමාජයෙන් ගිලිහීමට බලපෑ සාධක කවරේ ද?

(ලකුණු 08 යි)

02. ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතාවයේ වෙනස්කම් ඇති කිරීමට වාණිජවාදය දායක වූ ආකාරය පැහැදිලි කොට පසුකාලීනව එය පරිහානියට පත්වීමට බලපාන ලද සාධක මොනවාදැයි ගෙන හැර දක්වන්න.

(ලකුණු 20 යි)

03. (i) බටහිර යුරෝපයේ කාර්මික ධනවාදය ගොඩ නැගීමට කාර්මික විප්ලවය ඉවහල් වූයේ කෙසේ ද?

(ලකුණු 10 යි)

(ii) කාර්මික විප්ලවය දේශපාලන ක්ෂේත්‍රයේ ඇති කරන ලද වෙනස්කම් මොනවා ද?

(ලකුණු 10 යි)

04. "ප්‍රංශ විප්ලවය මිනිස් අයිතිවාසිකම් ලබා ගැනීමටකට වඩා ආර්ථික අයිතිවාසිකම් ලැබීම මූලික කරගත් ව්‍යාපාරයක් බැව් පැහැදිලි වේ." මෙම ප්‍රකාශය පැහැදිලි කිරීමට ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කරන්න.

(ලකුණු 20 යි)

05. (i) 16 වැනි සියවසේ මුල් භාගයේ දී ශ්‍රී ලංකාවේ පැවති සමාජ-ආර්ථික ව්‍යුහයේ මූලික ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි)

(ii) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාව සම්බන්ධව කොල් බෲක් කැමරන් කොමිසම පත් කිරීමට හේතු පාදක වූ අභ්‍යන්තර හා බාහිර සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

(iii) කෝල්බෲක් - කැමරන් ආර්ථික යෝජනා සැකෙවින් ගෙන හැර දක්වන්න.

(ලකුණු 06 යි)

06. (i) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ව්‍යාප්ත වූ වතු වගාව ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත ආර්ථික රටාව කෙරෙහි කවර ආකාරයේ බලපෑමක් සිදු කළේ ද යන්න විචාරාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු 10 යි)

(ii) කෝල්බෲක් - කැමරන් යෝජනා හඳුන්වා දීමෙන් පසුව 1840 ගණන්වල මැද භාගය දක්වා ශ්‍රී ලංකාවේ කෝපි වගාව මහා පරිමාණ මට්ටමින් ව්‍යාප්ත වීමට බලපාන ලද සාධක පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 10 යි)

07. (i) "කෝපි වගාවේ පරිහානිය ආරම්භ වන විට බ්‍රිතාන්‍ය වැවිලිකරුවන් තේ වගාව කෙරෙහි අවධානය යොමු කළ ද, එහි දී ඔවුනට සංරෝධක කිහිපයකට මුහුණ දීමට සිදුවිණි." ඉහත ප්‍රකාශ සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 08 යි)

(ii) 19 වැනි සියවස අගභාගයේ දී ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ පුළුල් ව්‍යාප්තියට ඉවහල් වූ සාධන විග්‍රහ කරන්න.

(ලකුණු 12 යි)

08. (i) 1830 ගණන්වල කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමෙන් පසු ගත වූ දශක හතරක පමණ කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ හටගත් වැදගත් ලක්ෂණ මොනවා ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්කම් සිදු කිරීම සඳහා යෝජනා කරන ලද "පාසල් කොමිසම" කෙතෙක් දුරට සාර්ථක මඟ පෙන්වීමක් ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

xxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxxx